සැ. යු. - 2008.12.26 දින පළ වූ අංක 1,582 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,583 - 2009 ජනවාරි මස 02 වැනි සිකුරාදා - 2009.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 22 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 23 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1716 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජනවාරි මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2008 දෙසැම්බර් මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

21 - B 079972— 9,120 (2009/01)

# බඩු බාහිරාදිය විකිණීම්

### දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය -මොරටුව

නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2009.01.25 වැනි දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳ හිමිකම් කියන්නන් සිටී නම් වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර පිට එදින පෙ. ව. 9.00ත් 9.30ත් අතර කාලය තුළ භාණ්ඩ පරීක්ෂාවට ඉඩදෙනු ලැබේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගැනෙන අවස්ථාවල දී අදාල භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා අත්පිට මුදල් ගෙවිය යුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

05. වෙන්දේසියේ මිලදී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේදීම අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය.

06. භාණ්ඩ මිලදී ගැනීමේදී අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත අත්‍යවශ්‍ය බව ද, මෙයින් දන්වමි.

බී. ඒ. ආර්. සෝමසිංහ,
දිසා විනිසුරු,
දිසා අධිකරණය,
මොරටුව.

2008 දෙසැම්බර් මස 03 වැනි දින,
මොරටුව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි ලේඛනය - 2009**

| | | | |
|---|---|---|---|
| 01. | ඒ. ආර්. 861/07 | පී. ආර්. 124 | අංකය අපැහැදිලි පාපැදි 01 |
| 02. | ඒ. ආර්. 862/07 | පී. ආර්. 133 | අංකය නොමැති පාපැදි 01 |
| 03. | ඒ. ආර්. 862/07 | පී ආර්. 133 | යකඩ කපන පොඩි කියත් 01 |
| 04. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 124 | ස්ටෑන්ඩඩ් වර්ගයේ අංකය නොමැති පාපැදි 01 |
| 05. | ඒ. ආර්.836/07 | පී. ආර්. 125 | ස්ටෑන්ඩඩ් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදි 01 |
| 06. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 126 | ස්ටෑන්ඩඩ් වර්ගයේ කලු පාට පාපැදි 01 |
| 07. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 127 | ස්ටෑන්ඩඩ් වර්ගයේ කළුපාට පාපැදි 01 |
| 08. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 128 | ලුමාලා වර්ගයේ පාපැදි 01 |
| 09. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 129 | සිංගර් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදි 01 |
| 10. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 130 | ස්ටෑන්ඩඩ් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදි 01 |
| 11. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 131 | රැලේ වර්ගයේ අංකය අපැහැදිලි පාපැදි 01 |
| 12. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 132 | ස්පෝට්ස් වර්ගයේ පාපැදි 01 |
| 13. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 133 | මවුන්ටන් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදි 01 |
| 14. | ඒ. ආර්. 836/07 | පී. ආර්. 137 | නිල් පැහැති ෂෙල් ගෑස් සිලින්ඩර් 01 |
| 15. | ඒ. ආර්. 715/07 | පී. ආර්. 137 | විසි කැති 01 |
| 16. | ඒ. ආර්. 715/07 | පී. ආර්. 137 | මිට සහිත දිග කැති 01 |
| 17. | ඒ. ආර්. 715/07 | පී. ආර්. 69 | නොකියා වර්ගයේ කැමරාව සහිත ජංගම දුරකථන 01 |
| 18. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 69 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 19. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 69 | නොකියා වර්ගයේ කැඩුනු ජංගම දුරකථන 01 |
| 20. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 71 | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 21. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 71 | පැනසොනික් වර්ගයේ දුරකථන 01 |
| 22. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 70 | මොබිටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 23. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 70 | ඇල්කටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 24. | ඒ. ආර්. 713/07 | පී. ආර්. 70 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 25. | ඒ. ආර්. 66 | පී. ආර්. 175 | වැසි අංක වී. 506876691 යමහා මේට් යතුරු පැදි 01 |
| 26. | ඒ. ආර්. 67 | පී. ආර්. 176 | වැසි අංක සීඩී 125 ටී - 1006687 හොණ්ඩා ට්වින් යතුරුපැදි 01 |
| 27. | ඒ. ආර්. 65 | පී. ආර්. 174 | වැසි අංක වී 50-6988271 යමහා මේට් යතුරු උපදි 01 |
| 28. | ඒ. ආර්. 96/08 | පී. ආර්. 137 | වැසි අංක වී. 50-6988271 යමහා මේට් යතුරු පැදි 01 |
| 29. | ඒ. ආර්. 96/08 | පී. ආර්. 137 | ඊටෙල් වර්ගයේ ජංගම දුරකථන 01 කැෂියෝ අත් ඔරලෝසුව |
| 30. | ඒ. ආර්. 01/08 | පී. ආර්. 162 | අඩි 05 අගල් 06ක් පමණ උස පිත්තල පහන් 01 |
| 31. | ඒ. ආර්. 0/08 | පී. ආර්. 119 | සෝනි වර්ගයේ ඩීවීඩී එක සහ එම දුරස්ථ පාලකය |
| 32. | ඒ. ආර්. 102/08 | පී. ආර්. 04 | මෝටරෝලා ජංගම දුරකථන 01 |
| 33. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 29 | අංකය වර්ගය අපැහැදිලි පාපැදි 01 |
| 34. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 30 | ලුමාලා වර්ගයේ පාපැදි 01 |
| 35. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 31 | මවුන්ටන් පාපැදි 01 |
| 36. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 32 | මවුන්ටන් පාපැදි 01 |
| 37. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 33 | වර්ගය අපැහැදිලි පාපැදි 01 |
| 38. | ඒ. ආර්. 214/08 | පී. ආර්. 34 | මවුන්ටන් පාපැදි 01 |
| 39. | ඒ. ආර්. 211/08 | - | වයර් ඔතන ලද 15 ජී. එක් මුල්ලක් කැඩී ඇති හෝන් 01 |
| 40. | ඒ. ආර්. 212/08 | පී. ආර්. 108 | නොකියා වර්යේ ජංගම දුරකථන 01 |
| 41. | ඒ. ආර්. 212/08 | පී. ආර්. 162 | විදුලි පංකා 01 |
| 42. | ඒ. ආර්. 212/08 | පී. ආර්. 161 | විදුලි ස්ත්‍රික්ක 01 |
| 43. | ඒ. ආර්. 212/08 | පී. ආර්. 161 | රෙගියුලේටරය සමග ගෑස් ලිප් 01 |
| 44. | ඒ. ආර්. 09/08 | පී. ආර්. 172 | යකඩ අලවංගු 01 |

| | | | |
|---|---|---|---|
| 45. | ඒ. ආර්. 210/08 | පී. ආර්. 173 | සුදු පාට නිකල් වර්ගයේ යකඩ වැටවල් කැලි 01 |
| 46. | ඒ. ආර්. 210/08 | පී. ආර්. 174 | නිකල් සහිත අඩි 1 1/2ක් පමණ උස පොලු 01 |
| 47. | ඒ. ආර්. 215/08 | පී. ආර්. 43 | නොකියා වර්ගයේ ජංගම දුරකථන 01 |
| 48. | ඒ. ආර්. 215/08 | පී. ආර්. 44 | සෝනි එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 49. | ඒ. ආර්. 215/08 | පී. ආර්. 45 | එරික්ෂන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 50. | ඒ. ආර්. 71770 | පී. ආර්. 38 | එරික්ෂන් දුරකථන/එම චාජරය |
| 51. | ඒ. ආර්. 71770 | පී. ආර්. 38 | නොකියා ජංගම දුරකථනය |
| 52. | ඒ. ආර්. 91432 | | බර්ගෝ මී. ලී. 200 තීන්ත ටින් 02. |

01-54

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : මාර්කස් මල්ටි ට්‍රේඩර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66246
ලියාපදිංචි කාර්යාලය : අංක 84, ධර්ම ශාලාව මාවත, ඔබේසේකර පුර, රාජගිරිය.

සමාගම් ලේකම්.

01-57

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

කැලණිය, සිංහාරමුල්ල, බියගම පාර, අංක 507 හි පදිංචි ෂානිකා නිරෝෂා පෙරේරා වන මා විසින් කැලණිය, සිංහාරමුල්ල, බියගම පාර, අංක 507 හි පදිංචි සුජත් කොස්මස් විජේසිංහ යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරමින් ඔහු වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. ෂිහාන් ඇන්තනීස් විසින් ලියා සහතික කරන ලද 2002.08.29 දාතම හා අංක 388 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර බල රහිත කරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ ඔහු විසින් කරනු ලබන මොනයම් හෝ කටයුත්තක් සඳහාවත් මෙතැන් සිට මා කිසිම වගකීමක් භාර නොගන්නා බවත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පොදු මහජනතාවටත් හා අන් සියලු දෙනාටත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

ෂානිකා නිරෝෂා පෙරේරා.

01-63

## වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : ක්‍රිස්ටෝෆර් මෛත්‍රී තෙරෆි සෙන්ටර්
සංස්ථාගත කළ දිනය : 2008 නොවැම්බර් මස 11
සමාගම් අංකය : ජී. ඒ. 2200
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ක්‍රිෂ්ටෝෆර් මෛත්‍රී තෙරෆි සෙන්ටර් අංක 763, අළුත් මාවත පාර, කොළඹ 15.

කෝපරේට් ප්‍රොෆෙෂනල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්.

අංක 37/1, කාසල් වීදිය,
කොළඹ 08.
දුරකථන අංක : 4866840.

01-23

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙහි පහත අත්සන් කරන කුරුණෑගල යටිගල්ඔලුව, වඩුවාව, හපුගස්යාය පදිංචි පිල්ලෑලියනගේ සුනීතා විජේවර්ධන වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ සියලු දෙනා වෙත දන්වා සිටින වගනම්, මා විසින් පිල්ලෑලියනගේ ප්‍රේමාවතී දයාරත්න යන අය පත්කරමින් වර්ෂ 2002 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින සයිප්‍රස් රාජ්‍යයේ ගරු කොන්සල් ජෙනරාල් වරයා විසින් සහතික කරන එවන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙම දැන්වීම ප්‍රසිද්ධ කර වර්ෂ 2008ක් වූ සැප්තැම්බර් මස 19 වැනි දිනයේ සිට අවලංගු කර අහෝසිකර ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන අතර, නිත්‍යානුකූල ලෙස බල රහිත කරන බවය. වැඩිදුරටත් ප්‍රකාශකර දැනුම් දී සිටින්නේ එකී ඇටෝර්නි බල පත්‍රය මගින් කරන ලද බලය අනුව යම් පුද්ගලයෙකුට හෝ යම් ආයතනයකට කරනු ලබන සියලු පැවරුම් හෝ වෙනත් බලතල නිත්‍යානුකූල නොවන හා බලරහිත වන බවත් එම කටයුතු පිළිබඳව මා මින් ඉදිරියට වග නොකියන බවත් ය.

පිල්ලෑලියනගේ සුනීතා විජේවර්ධන.

01-69

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : අයි. ඩී. එම්. කම්පියුටර් ස්ටඩීස් මුල්ලේරියාව (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 65037 දිනය : 2008 අගෝස්තු මස 01
ලියාපදිංචි කාර්යාලය : අංක 25, විශාඛා පාර, කොළඹ 04.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-116/5

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : සම්පත් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 66321 : 2008 නොවැම්බර් මස 25
ලියාපදිංචි කාර්යාලය : අංක22 ඒ, පැලවත්ත මාවත, නුගේගොඩ.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-116/4

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : හෙඩ්ලයින් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 66185 : 2008 නොවැම්බර් මස 13
ලියාපදිංචි කාර්යාලය : අංක 564, නාවල පාර, රාජගිරිය.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-116/3

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලෙස්ලීස් නියුට්‍රි/පූඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 65823 : 2008 ඔක්තෝබර් මස 08
ලියාපදිංචි කාර්යාලය : නවකඩ පාර, උඩබද්දාව.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-116/2

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : ලැටිටියුඩ් සික්ස්හන්ඩ්‍රඩ් ෆිප්ටි ෆයිව් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 65425 : 2008 සැප්තැම්බර් මස 05
ලියාපදිංචි කාර්යාලය : අංක 11, චාල්ස් වටරවුම, ජේදිස් පාර හරහා, කොළඹ 03.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-116/1

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ජේදයට අනුව පහත සඳහන් සමාගම ව්‍යාපාරික නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

සමාගමේ කලින් නම : රිජන්ට් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 3853
ලියාපදිංචි කාර්යාලය ලිපිනය : අංක 80/1, තර්ස්ටන් පාර, කොළඹ 03.
සමාගමේ අලුත් නම : ද රීජන්ට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික),
සමාගමේ ලේකම්වරු.

01-117

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනත කාණ්ඩ අංක 9 ප්‍රකාරව ඔකැන්මා ෆැබ්රික් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2008 දෙසැම්බර් මස 02 වැනි දින ලියාපදිංචි කරන ලදී

සමාගමේ නම : ඔකැන්මා ෆැබ්රික් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66389
ලියාපදිංචි ලිපිනය : අංක 30, තුඩුව, දාම්පේ, මඩපාත, පිළියන්දල.

සමාගම් අධ්‍යක්ෂ.

01-118

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනත කාණ්ඩ අංක 9 ප්‍රකාරව වැන්මිල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2008 ජනවාරි මස 03 වැනි දින ලියාපදිංචි කරන ලදී

සමාගමේ නම : වැන්මිල් ඉන්වෙන්ස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 62580
ලියාපදිංචි ලිපිනය : අංක 14/1, වැලිකඩ ප්ලාසා, රාජගිරිය.

සමාගමේ අධ්‍යක්ෂ.

01-119

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කිරීම පිළිබඳ දැනුම් දීමයි

සමාගමේ නම : සිප්ලා එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66258
ලියාපදිංචි කළ දිනය : 2008.11.24
ලියාපදිංචි ලිපිනය : අංක 280, පේරාදෙණිය පාර, මහනුවර.

සිප්ලා එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

01-73

## නිවේදනයයි

සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය සහ සෙලින්කෝ රියල් එස්ටේට් ඩෙවලොපර්ස් ලිමිටඩ් ආයතනය ඒකාබද්ධ කිරීම

2008 දෙසැම්බර් මස 17 වැනි දින වෙනම පවත්වන ලද මණ්ඩල රැස්වීම් වලදී සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ් (සී. අයි. සී. එල්.) ආයතනය සහ සෙලින්කෝ රියල් එස්ටේට් ඩෙවලොපර්ස් ලිමිටඩ් (සී. ආර්. ඊ. ඩී. එල්) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වන වගන්තිය විධිවිධාන ප්‍රකාර එකී සමාගම් දෙක සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ් යන තනි නාමයක් යටතේ ඒකාබද්ධ කිරීම පිණිස යෝජනා සම්මත කරගන්නා ලදී.

සී. අයි. සී. එල්. ආයතනය විසින් සී. ආර්. ඊ. ඩී. එල්. ආයතනයෙහි දරන ලද 99% කොටස් නියෝජනය අවලංගු කරමින් සහ ඒ සඳහා කිසිම ගෙවීමක් හෝ දීමනාවක් නොමැතිව මෙම ඒකාබද්ධ කිරීම බලාත්මක වන්නේ ය.

ඒකාබද්ධ කිරීම 2009 ජනවාරි මස 29 වැනි දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් දිනයක සිට බලාත්මක විය යුතුය.

ඒකාබද්ධ කරන ලද සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංක 55 1/1, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල, ගාලුපාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි සී. අයි. සී. එල්. ආයතනයෙහි වර්තමාන ලියාපදිංචි කාර්යාලය විය යුතුය.

ඉහත කී සමාගම්වල යම් බැඳීමක් හෝ අයිතියක් ඇත්තාවූ යම් කොටස් හිමියකුගේ ණයකරුවකු හෝ යම් තැනැත්තෙකු විසින් අධීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධ කිරීමේ යෝජනාවෙහි පිටපත් අංක 55 1/1, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල, ගාලුපාර, කොළඹ 03 යන ලිපිනයෙහි පිහිටි සී. අයි. සී. එල්. ආයතනයේ ලියාපදිංචි කාර්යාලයෙහි සාමාන්‍ය ව්‍යාපාර කාලසීමාවන්හි දී තබා ඇත.

ඉහත කී සමාගම් වල යම් බැඳීමක් හෝ අයිතියක් ඇත්තාවූ යම් කොටස් හිමියෙකු හෝ ණයකරුවකු හෝ යම් තැනැත්තකු විසින් ආයතනය සී. අයි. සී. එල්. ආයතනය හෝ සී. ආර්. ඊ. ඩී. එල්. ආයතනය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසු එකී ඒකාබද්ධකිරීමේ යෝජනාවෙහි පිටපතක් නොමිලේ ලබාගැනීමට හිමිකමක් ඇත.

නියෝජ්‍ය සභාපති,
සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ්/
සෙලින්කෝ රියල් එස්ටේට්, ඩෙවලොපර්ස් ලිමිටඩ්.
2008 ජනවාරි මස 02.

විධායක අධ්‍යක්ෂ,
සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට්ස් කෝපරේෂන් ලිමිටඩ්/
සෙලින්කෝ රියල් එස්ටේට්, ඩෙවලොපර්ස් ලිමිටඩ්.

01-110

**නිවේදනයයි**

සෙලින්කෝ ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනය සහ ඒසියන් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ඒකාබද්ධ කිරීම

සෙලින්කෝ ෆිනෑන්ස් පී. එල්. සී. ආයතනයේ (සී. එෆ්. පී. එල්. සී) සහ ඒසියන් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනයේ (ඒ. එෆ්. එල්) කොටස් හිමියන් විසින් 2008 දෙසැම්බර් මස 30 වැනි දින වෙන් වෙන් ව පවත්වන ලද අතිවිශේෂ මහා සභා රැස්වීම්වලදී, 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර එකී සමාගම් දෙක සෙලින්කෝ ෆිනෑන්ස් පී. එල්. සී. යන තනි විෂයයක් යටතට ගනිමින් ඒකාබද්ධ කිරීම පිණිස යෝජනා සම්මත කරගන්නා ලදී.

ඒ. එෆ්. එල්. ආයතනයේ කොටස් හිමිකම් විසින් තමන් ඒ. එෆ්. එල්. ආයතනයේ දරන ලද සෑම කොටස් දෙකක් (02) සඳහාම ඔවුන්ට සී. එස්. පී. එල්. සී. ආයතනයේ කොටස් හතක් (07) සඳහා හිමිකම් ලැබෙන පරිදි කොටස් හුවමාරුකරගැනීම මගින් එම ඒකාබද්ධ කිරීම බලාත්මක වේ.

ඒකාබද්ධ කිරීම 2009 ජනවාරි මස 29 වැනි දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් දිනයක සිට බලාත්මක විය යුතුය.

ඒකාබද්ධ කරන ලද සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංක 55 1/1, අයිස්ලන්ඩ් බිල්ඩින්, ගාලුපාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටි සෙලින්කෝ ෆිනෑන්ස් පී. එල්. සී. ආයතනයේ, වර්තමාන ලියාපදිංචි කාර්යාලය වන්නේ ය.

ඉහත කී සමාගම්වල යම් බැඳීමක් ඇත්තාවූ යම් කොටස් හිමියකුගේ ණයකරුවකු හෝ යම් තැනැත්තෙකු විසින් අධීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධ කිරීමේ යෝජනාවෙහි පිටපත් අංක 55 1/1, අයිස්ලන්ඩ් ගොඩනැගිල්ල, ගාලුපාර, කොළඹ 03 යන ලිපිනයෙහි පිහිටි සී. එෆ්. පී. එල්. සී. ආයතනයේ ලියාපදිංචි කාර්යාලයෙහි සාමාන්‍ය ව්‍යාපාර කාලසීමාවන්හි දී තබා ඇත.

ඉහත කී සමාගම් වල යම් බැඳීමක් ඇත්තාවූ යම් කොටස් හිමියෙකු හෝ ණයකරුවකු හෝ යම් තැනැත්තකු විසින් සී. එෆ්. පී. එල්. සී. ආයතනය හෝ ඒ. එෆ්. එල්. ආයතනය වෙත ඉල්ලීමක් කිරීමෙන් පසු එකී ඒකාබද්ධකිරීමේ යෝජනාවෙහි පිටපතක් නොමිලේ ලබාගැනීමට හිමිකමක් ඇත.

| | | |
|---|---|---|
| අත්සන් කළේ : | අත්සන් කළේ : | අත්සන් කළේ : |
| විධායක අධ්‍යක්ෂ | නියෝජ්‍ය සභාපති, | විධායක අධ්‍යක්ෂ |
| සෙලින්කෝ පිනෑන්ස් පී. එල්. සී. | සෙලින්කෝ පිනෑන්ස් පී. එල්. සී. /ඒෂියන් පිනෑන්ස් ලිමිටඩ්. | ඒසියන් පිනෑන්ස් ලිමිටඩ්. |

2009 ජනවාරි මස 02.

01-109

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/29160/ටී6/349

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2002.08.09 දින ගැසට් පත්‍රයේ සහ 2005.07.05 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය , පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.01.30 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර තල්පිටි දෙබැද්දේ, පට්ටිය උතුර හි පිහිටි දොඹගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. පී. එච්. ද සිල්වා විසින් සැකසූ 1995.11.11 දිනැති අංක 4356 දරන මිනුම් පිඹුරේ කැබලි අංක පී ( මෙය බලයලත් මිනින්දෝරු කේ.එස්. ඩබ්. පීරිස් විසින් සැකසුනු 1959.02.20 දින හා අංක 1478 දරන පිඹුරේ කැබලි අංක පී ලෙස දැක්වේ.) ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 4.56 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් සමඟ වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක එෆ් 196/235 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 1478 දරන පිඹුරේ කැබලි අංක එක්ස්, වයි සහ ආර් මතින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 3.

01-112/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/34557/පී6/220

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.06.17 දින ගැසට් පත්‍රයේ සහ 2005.09.19 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය , පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.01.30 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ වාද්දුව වස්කඩු දෙබැද්ද කුඩා වස්කඩුවේ හි පිහිටි මහවත්තේ කැබලි අංක සී2 නමින් හැඳින්වෙන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. ද එස්. උඹේසේකර විසින් සැකසූ 1996.06.09 දිනැති අංක 168 දරන මිනුම් පිඹුරේ කැබලි අංක සී2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0,රූ.0, පර්. 11.0 ක් වූ බෙදාවෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් සමග වේ.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක ජී124/19 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 168 දරන පිඹුරේ කැබලි අංක ඒ හා සී මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-112/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/34959/පී6/286

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.07.04 දින ගැසට් පත්‍රයේ සහ 2004.11.15 වැනි දා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය , පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2009.01.30 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, තල්පිටි දෙබැද්ද පානදුර නගර සභා සීමාව තුළ නල්ලූරුව, ජයන්ති මාවතේ, වරිපනම් අංක 25/12 දරන ස්ථානයේ පිහිටි මුදිල්ලගහවත්ත සහ පන්නපහල එරමුදුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්.ඩබ්. එල්. ද සිල්වා විසින් සැකසූ 1986.05.21 දිනැති අංක 5414 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0,රූ. 0, පර්. 14 ක්වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක එෆ් 177/153 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 5414 දරන පිඹුරේ කැබලි අංක 8ඒ, 4 ඒ, සහ 4 (පාරවල් සඳහා වෙන් කරන ලද) බිම් කොටස් මතින් හා හරහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 දෙසැම්බර් මස 19 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 3.

01-112/3

---

### පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජනවාරි මස 20 වැනි දින පෙ. ව. 10.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කිරිල්ලවල ගමේ අලුබෝගහකුඹුර හෙවත් ගලබොඩකුඹුර පිල්ලෑව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 1360 සහ 2001.06.29 වැනි දින දරන සැලැස්මේ නිරූපිත ලොට් 5 දරන බිම් කැබැල්ල ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 9.30 සහ එහි තුළ ඇති ගොඩනැගිලි ගහකොළ සියලු දේ සමග වේ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. පී. කුරේ විසින් සහතික කරන ලද අංක 5539 සහ 2005.08.04 දින දරන උකස්කරය මත ලැබිය යුතු

මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් බන්දුලාල් හේමන්ත බඳුගේ සහ චාන්දනී සමන්තා බඳුගේ යන අය විසින් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.12.19 වැනි දින ලක්බිම සුඩර් ඕලි සහ ඩේලි නිව්ස් පුවත් පත් සහ 2008.12.26 වැනි දින *ගැසට් පත්‍රය* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ සිට නුවර පාරේ කිලෝ මීටර් 12 1/2 ගිය විට කිරිල්ලවල වාහන විකිණීමේ මධ්‍යස්ථානයට යාබදව අදාළ විකිණීමට ඇති දේපළ මහ පාරට මුහුණ ලා දකුණු පසින් හමුවේ. අදාළ දේපළ කන්ද කපාපු හංදියට සැතපුම් 1 ක් මෙහායින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් (සියයට දහයක්) 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2%ක් ද, (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-108/1

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 ජනවාරි මස 20 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභා සීමාවේ දෙල්ගහවත්ත ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. ගුණතිලක විසින් සාදන ලද අංක 3460 සැලැස්මේ නිරූපිත ලොට් 5 ඒ දරන බිම් කැබැල්ල ප්‍රමාණය අ. 0 රූඩ්. 0 පර්. 5 සහ ලොට් 5 බී දන බිම් කැබැල්ල ප්‍රමාණය අ. 0 රූ. 0 පර්. 3.32 සහ එහි තුළ ඇති ගොඩනැගිලි ගහකොළ සියලු දේ සමග වේ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එල්. ගොඩ්ප්‍රි කුරේ විසින් සහතික කරන ලද අංක 5443 සහ 2004.11.01 දින සහ අංක 5535 සහ 2005.07.11 දින දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් අහමඩ් හුසෙන් මොහොමඩ් නවුශාඩ් නොහොත් හුසෙන් මොහොමඩ් නවුශාඩ් යන අය විසින් උකස් කරන ලද දේපළ.

අංක එම්/එෆ්/22/78 (සීඑච්/ඕ/1151/1544) දරන පිඹුරේ ලොට් අංක 10 ලෙස නිරූපිත කොටසෙහි මාර්ග අයිතිය සහ අංක එම්/එෆ්/22/78 දරන පිඹුරේ (ලොට් අංක 7 මාර්ගය සඳහා වෙන්කොට ඇත) දක්වා ඇති පර්සි ඩයස් මාවත මතින් වූ මාර්ග අයිතිය.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.12.19 වැනි දින ලක්බිම සුඩර් ඕලි සහ ඩේලි නිව්ස් පුවත් පත් සහ 2008.12.22 වැනි දින *ගැසට් පත්‍රය* ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කොළඹ නගර සභාවේ සිට කැලණි පාලමේ කොළඹ - මීගමුව පාරේ කි. මී. 6.5 ගිය විට මාබෝල මුස්ලිම් පල්ලිය අසල වමට ඇති පර්සි ඩයස් මාවත මීගමුව පාරට හමුවන මංසන්ධියේ විකිණීමට ඇති දේපළ මහ පාරට මුහුණ ලා දකුණු පසින් හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් (සියයට දහයක්) 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2%ක් ද, (සියයට දෙකහමාරක් පමණ)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය අංක 450 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-108/2

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නුගේගොඩ ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2005.10.18 දිනැති සහ අංක 557 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ධනංජය ප්‍රදීප් කොඩිකාර යන අය ණයකරු හැටියට පැහැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ ජනවාරි මස 22 වැනි දින ප. ව. 2.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩගහ පත්තුවේ කිරිවත්තුඩුවේ මුරියත් වයිට් ස්ට්‍රේට් හි බලයලත් මානක පී. වැලිකල විසින් 2005.07.23 වැනි දින පිඹුරු අංක 476 හි ලොට් අංක 126 දරන කොටස (බලයලත් මානක එම්. ජේ. සේතුංග විසින් 1969.04.11 දින නැවත මනින ලද පිඹුරු අංක 504 හි ලොට් අංක 126 දරන ඉඩම් කොටස වේ.

*ඉඩමට පිවිසුම් මාර්ගය*.- කොට්ටාව හංදියේ සිට හොරණ පාර, ඔස්සේ කි. මී. 9 ක් පමණ පසු කළ විට 'මූණමලේ වත්ත' පාරෙහි පිහිටි 2 වැනි පටුමගෙහි මෙම ඉඩම පිහිටා ඇත.

විශාලත්වය .- පර්චස් 20

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.07 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.18 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් (සියයට දහයක්) 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500)ක් ද,
6. සියළුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

01-108/3

---

### හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. කොල්ලුපිටිය ශාඛාව
### (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2005.08.17 දිනැති සහ අංක 371 දරන බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් ලියා සහතික කරන ලද්දා වූ ද 2007.08.17 දින අංක 3534 දරන නිවැරදි කිරීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කෝරට්ටගමගේ ගැමුණු යන අය ණයකරු හැටියට පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිටුවල්ගොඩ සහ කීණිගම පිහිටි දම්බුවාවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එන්. හේරත් විසින් මැන සාදන ලද 2005.04.30 දින සහ අංක 2004/273 ඒ දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් අංක 3 දරන කොටස.

*ඉඩමට පිවිසුම් මාර්ගය*.- නුවර පාරේ සිට මිරිස්වත්ත හංදිය පසුකලත්ම දකුණු පැත්තේ පිහිටි වතුරේගම පාරට හැරී කිලෝමීටර් 2ක් පමණ ගොස් වමින් පිහිටි කීණිගම, බටගොල්ල පාරේ මීටර් 100ක් පමණ ගිය විට දකුණු පැත්තේ දම්බුවාවත්ත වන මෙම ඉඩමට පිවිසිය හැක.

විශාලත්වය .- පර්චස් 14.70 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.17 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.05 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් (සියයට දහය) 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. ලිපිකරු හා සොෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම බ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

01-108/6

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මාළිගාවත්ත ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පි. වෙත්තසිංහ විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ ද 2004.10.05 දිනැති සහ අංක 2271 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කීර්තිසිංහ සරත් ගොඩැල්ලවත්ත ආරච්චිගේ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ ජනවාරි මස 26 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මාළිගාවත්ත බටහිර අංක 15 වසමේ පිහිටි ජයන්ත වීරසේකර මාවතේ, වරිපනම් අංක 229/1 හි පහත මාලයේ පිහිටි බලයලත් මානක කේ. ඩී. ෆීලික්ස් ආර්. පෙරේරා විසින් මැන සාදන ලද අංක සී. ඕ. එන්. ඒ. 104ඒ/ලොට් 55 සහ 1984 දෙසැම්බර් මස 27 වැනි දින දරන සභාධිපත්‍ය පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ද ගෘහස්ත බී 49/ජී/4 දරන සභාධිපත්‍ය ඒකකය ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

*ඉඩමට පිවිසුම් මාර්ගය.*- මරදාන සිට ජයන්ත වීරසේකර මාවත ඔස්සේ ගොස් වමට හැරී මාළිගාවත්ත තට්ටු නිවාස දෙසට ගමන් කළ විට පහත මාලයේ ජයන්ත වීරසේකර මාවතේ, වරිපනම් අංක 229/1 දරන මෙම තට්ටු නිවාසය පරිසර මාවතට මුහුණලා පිහිටා ඇත.

විශාලත්වය .- වර්ග අඩි 445

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.17 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.04 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් (සියයට දහයක්) 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සොෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500)ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජොෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.

අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

01-108/5

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මොරටුව ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියා සහතික කරන ලද්දාවූ පිළිවෙළින් 2002.09.05 දින සහ අංක 5456, 2002.11.25 දින සහ අංක 5602 සහ 2003.12.05 දින සහ අංක 6160 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවත්තගේ නිමල් ඩන්ස්ටන් චන්ද්‍රසිරි ප්‍රනාන්දු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009 ක් වූ ජනවාරි මස 29 වැනි දින පෙ. ව. 10.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ ඉඩමේ පිහිටි ගාලු පාර, වරිපනම් අංක 760/4 දරන මාදන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මානක ජී. පී. අබේනායක විසින් මැන සාදන ලද අංක 3134 ඒ සහ 2001.09.14 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වේ.

*ඉඩමට පිවිසුම් මාර්ගය.*- ගාලු පාර දිගේ මොරටුව කුරුස හංදියෙන් මොරටුව ලංකා බැංකුව ඉදිරිපිටින් දකුණට හැරී හමුවන පුද්ගලික පාර දිගේ මීටර් 75 ක් යනවිට අදාළ ඉඩම හමුවේ.

විශාලත්වය .- පර්චස් 17.32 යි

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.10.17 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.07 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් 10%ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයි (රු. 500) ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000) ක් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.

01-108/4

**කොළඹ දිසා අධිකරණයේ අංක 17631/එම්. බී දරන නඩු තීන්දුව අනුව මා වෙත පවරා ඇති අධිකාරිය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසිය**

සීමාසහිත එල්. බී ෆිනෑන්ස්,
අංක 101, විනයාලංකාර මාවත, කොළඹ 10,
සහ දැනට අංක 275/75 මහාචාර්ය
ස්ටැන්ලි විජේසුන්දර මාවත, කොළඹ 7.

*පැමිණිලිකරු*

කොටිගලගේ සුමින්ද නිරෝෂන පෙරේරා,
අංක 53, පල්ලියවත්ත, හැඳල, වත්තල.
අංක 179/35, ගොරකගහහේන, බොරුල්ල.

එදිරිව

.................................විත්තිකරු

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ හැඳල උප කාර්යාල සීමාව තුළ පල්ලිය වත්තේ පිහිටි, ගොරකගහවත්ත, කොටුවේ කුඹුර, සිරිපිනාවත්ත, බොරළුගහ වත්ත සහ මිදෙල්ලගහවත්ත නමැති ඒකාබද්ධ ඉඩමෙන් මැන බෙදා වෙන්කළ එම්. ඩී. ජේ. පෙරේරා බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 547 හා 2000.06.29 දින දරන පිඹුරේ ප්‍රකාර අංක 1 බී දරන ප්‍රමාණයෙන් පර්චස් 23 ක් වන ඉඩම් කැබැල්ල විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු යයි ගරු අධිකරණය තීන්දු ප්‍රකාශකර ඇති අයුරු රු. 6,93,619.07 ක මුදලක් ද, වර්ෂ 2005 ක් වූ අප්‍රේල් මස 20 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය වන 2006.10.05 දක්වා මසකට 4% ක පොළිය ද ඉන්පසු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් තීන්දු ප්‍රකාශයේ මුළු මුදලට පොළිය ද ගරු අධිකරණයේ බලය ලත් නිළධාරියෙකු විසින් තක්සේරු කරණු ලබන නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා 2009 ජනවාරි මස 27 වැනි අගහරුවාදා පෙරවරු 11.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණේ.

*ඉඩමට ප්‍රවිශ්ඨ වීම*.- මෙම ඉඩමට ප්‍රවිශ්ඨවීම සඳහා කොළඹ මීගමුව පාරේ වත්තල පසුකර ගොස් හැඳල හන්දියෙන් වමට ඇති හේකිත්ත පාරේ. කි. මී. 3 පමණ ඉදිරියට ගොස් ඇලකන්ද මාර්ගයට පිවිස එම මාර්ගයේ උතුරු දිශාවට කිලෝ මීටර් 1/2ක් පමණ ගොස් වම් අත පැත්තේ ඇති හැමිල්ටන් ඇල පාලමෙන් පල්ලිය වත්ත මාර්ගයට පිවිස කි. මීටර් 1ක් පමණ ඉදිරියට ගිය විට දකුණු අත පැත්තේ දක්නට ඇති කතෝලික පල්ලිය ඉදිරිපිටින් වමට ඇති මාර්ගය ඔස්සේ මීටර් 100ක් පමණ ඉදිරියට ගොස් වමට ඇති ලංකා මාතා පාර පසුකර තවත් මීටර් 20ක් පමණ ඉදිරියට යද්දී වම් අතට ඇති විටැලිටි ඉන්වෙස්ට් කෝපරේෂන් ආයතනය ද, පසුකර ඉදිරියට තමත් මීටර් 50ක් පමණ ගොස් හමුවන කතෝලික ප්‍රතිමා මන්දිරය ඉදිරියෙන් දිවෙන වම් අත පැත්තේ පාරේ මීටර් 50ක් පමණ ඉදිරියට ගොස් වම් අත පැත්තේ ඇති අංක 204 දරන නිවසේ නැගෙනහිර මායිමේ තාප්පය අයිනෙන් වැටී ඇති බොරළු පාරේ (මෙම මාර්ගය පටන් ගන්නා තැන වම් අත පැත්තේ පල දරන කැඹිලි ගසක් දක්නට ලැබේ) මීටර් 20ක් පමණ ඉදිරියට ගිය විට හමුවන ඉඩම් කට්ටි 4ක් දකුණු බස්නාහිර මායිම තුළ පිහිටි මෙම ඉඩමට පිවිසිය හැකිය. මෙම ඉඩමේ බස්නාහිර මායිම යාබද ඉඩමේ පිහිටා ඇති බ්ලොක් ගල් බැඳි තාප්පය ද වේ.

*විකිණීමේ කොන්දේසි*.-

1. මිටිය පහත හෙලන විට ඉහළම ලංසුව තබා තීන්දු මුදලින් 25% ක අත්තිකාරම් මුදලක් ද, (ආපසු ගෙවනු නොලබන) 2 1/2% වෙන්දේසිකරුගේ ගාස්තුව ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වෙන්දේසිකරුගේ කොමිස් මත 15% ක වැට් බද්දක් ද, දැන්වීම් ගාස්තු ද, විකුණුම් ගිවිසුම පිළියෙල කිරීමේ හා මුද්දර ගාස්තු ද, ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු 1% විකුණුම් බද්ද ද, අධිකරණය වෙත ගෙවිය යුතු 1/2% කණු ගාස්තු ද ගෙවිය යුතු ය.

2. ඉතිරි 75% වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත දී අධිකරණයට ගෙවිය යුතු වන අතර, වෙන්දේසිකරු විසින් නියම කරනු ලැබුවහොත් එසේ ගෙවන බවට සහතික වීමට පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු වෙන්දේසි දිනයේ දී ඉදිරිපත් කිරීමට ගැණුම්කරු බැඳී ඇත.

වැඩි විස්තර සඳහා වෙන්දේසිකරු විමසන්න.

.

එස්. නිමල් ද සිල්වා සා. වි,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්.

අංක 439/1, ඇල්විටිගල මාවත,
කොළඹ 05, දුරකථන අංක : 2582213.

01-70

---

**පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

වෙන්නවත්තේ, වෙන්නවත්ත පාරේ වරිපනම් අංක 15 ඊ දරන ස්ථානයේ පිහිටි පර්චස් 12.50 ක් විශාලැති වටිනා නිවසක් සහිත ඉඩමක්

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන් පහළ දකුණු අළුත්කුරු කෝරළයේ, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවේ වෙන්නවත්තේ පිහිටි වෙන්නවත්ත පාරේ දැනට වරිපනම් අංක 15 ඊ දරන දොඹගහඕවිටවෙල දරන ඉඩමට බලයලත් මිනින්දෝරු අනිල් නවගමුව මහතා විසින් 2007.02.27 වැනි දින සම්පාදිත අංක 2974 දරන පිඹුරේ දැක්වෙන කැබලි අංක 5 ඒ දරන කොටසේ පිහිටි නිවස ගහකොළ යනාදී දෙත් සමග පිහිටියාවූ ඉඩම. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දෙළවත්තගේ විසින් සහතික කරන ලද්දාවූ ද, කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් හඳුන්වනු ලද්දාවූ දැනට පීකිව් 48 යටතේ ලියාපදිංචි කර ඇති පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2007.03.14 දිනැති අංක 2317, 2007.09.03 දිනැති 2452 හා 2007.12.12 දිනැති අංක 2547 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල ගෙවීමට අබ්දුල් හමීඩ් ෆාතිමා ඉම්රෝසා හෙවත් ෆාතිමා ඉම්රෝසා හමීඩ් හෙවත් ෆාතිමා ඉම්රෝසා ලියාකත් අලී යන අය පැහැර හැර ඇති බැවින් කලින් පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් හඳුන්වනු ලද්දාවූ දැනට පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් විසින් මා වෙත පවරණ ලද බලය මත ඉහත කී දේපල වර්ෂ 2009 ක් වූ ජනවාරි මස 19 වැනි දින පෙ. ව. 10.30 දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2008.12.26 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2008.12.22 සිලොන් ඩේලි නිව්ස්, ලක්බිම සහ සුඩර්ඔලි යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.-* ඔරුගොඩවත්තේ සිට අවිස්සාවේල්ල දෙසට වැල්ලම්පිටිය මංසන්දිය පසුකර මීටර් 100 ක් පමණ ගොස් වමට හැරී වෙන්නවත්ත පාරේ මීටර් 100-150ක් පමණ ගිය පසුව පාරේ වම් පසින් මෙම දේපළ හමුවේ.

වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක්ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියළුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 03 ගාලු පාරේ අංක 450 දරන ස්ථානයේ පිහිටි පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී නීති ගෙන් විමසන්න. දුරකථන අංක 2565573, 2565570, 2565571 සහ 2565565.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක 2873656, 0777-672082, ෆැක්ස් අංකය : 2871184.

12-58

---

### පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ විකිණීම

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවට අයත්, රුද්‍රා මාවතේ, පාමංකඩ බටහිර, රුද්‍රා මාවත, අංක 29 දරන ස්ථානයේ පිහිටි, බලය ලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකස් කරන ලද 1990 ජූනි මස 15 වන දින දරන පිඹුරුපත් අංක 2798 හි ලොට් අංක 3040 සහ 3041 ලෙස සඳහන් 'නුගගහවත්ත' ලෙස හැඳින්වෙන (129 වන වෙලුමේ, පත් ඉරු අංක 261, වැල්ලවත්ත ලියා පදිංචි පිඹුරුපත් අංක 2 හි, ලොට් අංක 1824 හි නැවත මිනුමක් සහ කොටස් කිරීමක් වන) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

*ඉඩමේ ප්‍රමාණය :* ලොට් 3040 අක්. 0, රූ. 0, පර්. 9.67 ලොට් 3041 අක්. 0, රූ. 0, පර්. 8.67 එහි පිහිටි ගොඩනැගිල්ල සහ සියල්ල සහිතව

*මාර්ගය සහ පිහිටීම .-* වැල්ලවත්ත මංසන්ධියේ සිට (විදුලි සංඥා මංසන්ධිය) ගාලු පාර ඔස්සේ දෙහිවල දෙසට මීටර් 250ක්, වැල්ලවත්ත කොමර්ෂල් බැංකුව දක්වා පැමිණෙන්න. එහි සිට වමට එනම් රුද්‍රා මාවතට හැරී මීටර් 125ක් පැමිණිවිට මෙම දේපළට ලඟාවිය හැක. මෙය රුද්‍රා මාවතේ වම් පැත්තේ පිහිටා ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්ත විසින් සහතික කරන ලද සීමාසහිත ලෑන්ඩ් මාර්ක් ඉංජිනියරින් (පෞද්ගලික) ආයතනය විසින් 2006 පෙබරවාරි මස 06 වන දිනැති අංක 1954 දරන සහ 2006 පෙබරවාරි මස 07 වැනි දිනැති අංක 1956 දරන උකස්කරයන් ප්‍රකාර පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී (සීමාසහිත පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 ජනවාරි මස 22 වන දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.-*මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිලෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000 කට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2008 දෙසැම්බර් මස 26 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද, 2008 දෙසැම්බර් මස 18 දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450 සීමාසහිත පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000 සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ, උපදේශක තක්සේරුකරුවෝ සහ
ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*

අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593.
දුකරථන/ෆැක්ස් අංකය : 081-2224371.
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථ අංක : 011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176.
ඊමේල් : schokman@samera1892.com.

*වෙබ් අඩවිය* : www.schokmanandsamerawickreme.com

01-77

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ 05, නාරාහේන්පිට , කිරුළ පාර, අංක 92 හි පදිංචි සීමාසහිත කුටින් ඉන්ටර් නැෂනල් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් සඳහා උකස් කළ වලපනේ ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල හි පිහිටි නිකවෙල කහටගහලන්දහේන, නිකවෙල, තැන්නේහේන සහ නිකවෙලහේන නැමැති ඉඩම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 2008.09.12 දිනැති අංක 1567 දරන *ගැසට් පත්‍රයේ* හා 2008.09.05 දිනැති ඩේලිනිව්ස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදී ම 2009.01.17 වැනි දින පෙ. ව. 11.00 ට කෝට්ටේ, පිටකෝට්ටේ මහානාම ඩ්‍රයිව්, අංක 474 හි පදිංචි වෙන්දේසිකාර ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමුවන උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔය පළාත කෝරළයේ වලපන හි වලපනේ ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල හි පිහිටි 'නිකවෙල කහටලන්දහේන, නිකවෙල තැන්නහේන සහ නිකවෙලහේන නැමැති යැබැඳි ඉඩම් වලින් බලයලත් මිනින්දෝරු ඒ. එස්. එම්. අස්වද් විසින් සාදන ලද 1993 අගෝස්තු මස 10 දිනැති අංක 1950 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1, 2, 3, 4, 5 සහ 6 වශයෙන් සඳහන් කළ බෙදන ලද ඉඩම් කැබලි ඉහත සඳහන් අංක 1950 දරන පිඹුරේ විස්තර කළ යාබැඳිව පිහිටා ඇති ඉහත සඳහන් ඉඩම් කැබැලි 1, 2, 3, 4, 5 සහ 6 එකම ඉඩමක් සේ යාකර ඇති අතර උතුරට : ආර්. එම්. ගුණතිලකට අයත් නිකවෙල කුඹුර සහ ටී. එම්. ප්‍රේමතිලකට අයත් නිකවෙල කුඹුරද, ඊසානට : ටී. එම්. ප්‍රේමතිලකට අයිති නිකවෙල කුඹුර වෙන්කරන ඇල සහ පී. බී. එම් හේරත්ට අයත් නින්දපිටිය නැමැති කුඹුරද, නැගෙනහිරට : එස්. එච්. හේරත්ට අයිති දේපළ සහ ඩබ්. එම්. විජේසිංහට අයිති දේපළ ද, දකුණට : කාණුව සහ නුවර සිට මහියංගන දක්වා මහා මාර්ගය ද, බන්නාහිරට කේ. ඩබ්. එම්. හීන්මැණිකාට අයිති නිකවෙලහේන සහ ටී. එම්. ප්‍රේමතිලකට අයිති නිකවෙලකුඹුර වෙන් කරන ඇල ද, වයඹට : ටී. එම්. ප්‍රේමතිලකගේ නිකවෙල කුඹුර වෙන් කරන ඇල ද, මායිම්ව අක්කර පහයි රූඩ් එකයි පර්චස් පහළොවක් (අ. 5 රූ. 1 පර්. 15) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය ඉඩම නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 0155/127 හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බන්ධනදායීට අයත් භාණ්ඩ තොග ඇතුළු වංචල යන්ත්‍ර සූත්‍ර හා බඩුබාහිරාදිය පහත සඳහන් වේ.

| *Index Quantity No.* | *Name of the Machine* | *Brand Name* | *Model Numbers* | *Made in* | *Quantity* |
|---|---|---|---|---|---|
| 1. | Single Needle Lock Stitch | Juki | DDL-8500 | Japan | 122 |
| 2. | Single Needle Lock Stitch | Juki | DDL-880 | Japan | 48 |
| 3. | Single Needle Lock Stitch | Typical | GC-6150H | - | 32 |
| 4. | Single Needle Lock Stitch Under Bed Trimmer | Juki | DDL-8700-7 | Japan | 8 |
| 5. | Single Needle Lock Stitch Under Bed Trimmer | Kaixuan | KX-8500-5-6D | Japan | 4 |
| 6. | Single Needle Under Bed trimmer | Typical | GC6180ME3 | Japan | 30 |
| 7. | Single Needle Edge Cutter | Juki | DLM-5200 | Japan | 3 |
| 8. | Single Needle Edge Cutter | Toyota | LS2-B347 | Japan | 3 |
| 9. | Double Needle | Juki | LH-3128 | Japan | 0 |
| 10. | -do- | Brother | LT2-B842-3 | German | 7 |
| 11. | Overlock (5 thread) | Juki | MO3616/M 02366N | Japan | 16 |
| 12. | Overlock (5 thread) | Typical | GN-2000-5 | Japan | 7 |
| 13 | Overlock (3 thread) | Juki | 2354N | Japan | 1 |
| 14 | Overlock (6 thread) | Kaxuan | KX767 | Taiwan | 2 |
| 15 | Overlock (6 thread) | Pegasus | M600 | Taiwan | 13 |
| 16 | Button hole | Brother | LH-4-D814 | German | 5 |

| *Index Quantity No.* | *Name of the Machin1e* | *Brand Name* | *Model Numbers* | *Made in* | *Quantity* |
|---|---|---|---|---|---|
| 17 | Key Button Hole/ Eye Button Hole | Durkopp Addler AG | 0558- 241391 | German | 1 |
| 18 | Key Button Hole/ Eye Button Hole | Reece | 101 | USA | 3 |
| 19 | Multi Needle Chain Stitch | Kansai-Special | DFB1412P | Japan | 4 |
| 20 | Kansai Loop Machine | Kansai Special | B-200C | Japan | 1 |
| 21 | Flatlock Machine | Pegasus | W664-03SB | German | 1 |
| 22 | Blind Stitch/ Blind Hem | US Stitch Line | SL718-2 | | 4 |
| 23 | Feed of the Arm | Juki | MS-1190M | Japan | 4 |
| 24 | Feed of the Arm | Juki | MS/191 | Japan | 2 |
| 25 | Velcor Attached Electronic | Juki | LK-1930 | Japan | 1 |
| 26 | Button Attach Electronic | Juki | LK-1903 | Japan | 3 |
| 27 | Button Attach (Lock Stitch) | Juki | LK-1851 | Japan | 2 |
| 28 | Button Attach (Chain Stitch) | Juki | MB-373 | Japan | 4 |
| 29 | Snap Button Attach Machine | Juki | | Japan | 3 |
| 30 | Bartac Machine Electronic | Juki | LK-1900 | Japan | 3 |
| 31 | Bartac Normal | Juki | LK-1850 | Japan | 5 |
| 32 | Welt Pocket Attach Machine | Durkopp Addler | 0935- 00024600 | German | 1 |
| 33 | Zigzag Machine | Kaixuan | 20 U53 | | 3 |
| 34 | Cutting Machine 08" (Blue Streak II) | Eastman | 629X | USA | 1 |
| 35 | Cutting Machine 10" (Blue Streak (II)) | Eastman | 629X | USA | 2 |
| 36 | Cutting Machine 10" | Eastman | 829 | Taiwan | 1 |
| 37 | Cloth Drill maker 08" | Eastman | CD-3 | USA | 1 |
| 38 | Band Knife (3700 m.m.) | C. K. S. | | Japan | 1 |
| 39 | End Cutter Machine | Sulee | 2611N | Japan | 2 |
| 40 | Pattern Cutter (Template Making) | Racing | K-1 II | | 1 |
| 41 | Needle Search FM | Cintex | | England | 1 |
| 42 | Complete Topper (Big Jim) | Comptel Topper | 330 | Italy | 2 |
| 43 | Pony Stain remover | Pony | 20065 | Italy | 1 |
| 44 | Fusing Machine | Korea Fiblon | HBP H- 100D | Korean | 1 |
| 45 | Fusing Machine | | NHG-900 | China | 1 |
| 46 | Fabric inspection Machine | | | Chaina | 1 |
| 47 | Light Box (the judge II) | Gretagmac Beth | | Hongking | 1 |
| 48 | Thread Sucker | Toyota | | Japan | 1 |
| 49 | Susmen Electric Boiler (24 KW) | Susmen | ES 24 | | 1 |
| 50 | Susmen Electric Boiler (68 KW) | Susmen | ES 72 | | 1 |
| 51 | Striping Machine | - | - | | 1 |
| 52 | Collar Turn Machine | - | - | | 2 |
| 53 | Air Compressor (4.0kw) | - | - | | 1 |
| 54 | Air Compressor (1.5kw) | Europa 440 | - | | 1 |
| 55 | Generator (200kw) | Caterpillar | S. No. 852120 03 Model No. 3306DI | U. S. A. | 1 |
| 56 | Generator (2KW) | Sri Ram Honda | SA-4 S. No. 8 JF007 52 | | 1 |
| 57 | Pre Fabricated Steel Racks | | | South Africa | 1 |

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, පන්නල හි පිහිටි 'කීර්ති බණ්ඩාරපුර' නැමැති ඉඩමේ පිහිටි සීමාසහිත කුටින් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම නැමැති පරිශ්‍රයෙහි (මින්පසු බන්ධනදායි සතු යන්ත්‍රසූත්‍ර උපකරණ යනුවෙන් සාමූහිකව සඳහන් සියල්ල) විස්තර කළ තනි හා සියලු චංචල දේපළ සියල්ල හා ගෘහභාණ්ඩ උපකරණ සවිකිරීම් හා භාණ්ඩ මින්පසු වරින්වර අඛණ්ඩව එකී පරිශ්‍රයේ තබා ඇති හෝ පරිශ්‍රයට ගෙන එනු ලබන ඉහත විස්තර කළ හා අනෙකුත් චංචල දේපල සියල්ල හා මින්පසු බන්ධනදායි විසින් විටින්විට ඉවත් කරන ඉහත කී යන්ත්‍ර සූත්‍ර උපකරණ ද බන්ධනදායිගේ චංචල දේපළ ද, බන්ධනදායිගේ වෙළඳාම් හෝ ව්‍යාපාර හෝ යන්ත්‍ර සූත්‍ර උපකරණ දේපළ ගබඩාව හා අනෙකුත් චංචල දේපළ ද වේ.

මහජන නොතාරිස් රේණුක ද සිල්වා සහ මහජන නොතාරිස් මනෝහරි ගුණසේකර (විවාහයට පෙර) වලිසිංහ විසින් සහතික කරන ලද පිළිවෙලින් 1998.06.18 හා 1996.11.20 දිනැති අංක 264 හා 1023 දරන උකස් බැඳුම්කර හා මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2006.10.26 දිනැති අංක 1635 හා 1636 දරන උකස් බැඳුම්කර දෙකක්.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ඩී. සිල්වා,
සම්බන්ධතා කළමනාකරු,
අයකරගැනීම් - ආයතනික.

අංක 4, ලංකා බැංකුව,
ලංකා බැංකු මාවත,
කොළඹ 01

01-138

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2008 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2008 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2008 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය | 2,080 0 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) | 1,300 0 | 3,120 00 |
| III වැනි ඡේදය | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (**I**. **II** සහ **III** ඡේද තුන ම ඇතුළත් ව) | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස | 580 00 | 3,120 00 |
| III වැනි කොටස | 405 00 | 3,120 00 |
| **IV** වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) | 890 00 | 2,400 00 |
| **V** වැනි කොටස | 860 00 | 420 00 |
| VI වැනි කොටස | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොළස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) | 25 00 | 60 00 |
| III වැනි ඡේදය | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (**I**. **II** සහ **III** ඡේද තුන ම ඇතුළත් ව) | 80 00 | 120 00 |
| II වැනි කොටස | 12 00 | 60 00 |
| III වැනි කොටස | 12 00 | 60 00 |
| **IV** වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) | 23 00 | 60 00 |
| **V** වැනි කොටස | 123 00 | 60 00 |
| VI වැනි කොටස | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2009** | | | |
| ජනවාරි | 2009.01.02 | සිකුරාදා | 2008.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.09 | සිකුරාදා | 2008.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.16 | සිකුරාදා | 2009.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.23 | සිකුරාදා | 2009.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.30 | සිකුරාදා | 2009.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2009.02.06 | සිකුරාදා | 2009.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.13 | සිකුරාදා | 2009.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.20 | සිකුරාදා | 2009.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.27 | සිකුරාදා | 2009.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2009.03.06 | සිකුරාදා | 2009.02.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.13 | සිකුරාදා | 2009.02.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.20 | සිකුරාදා | 2009.03.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.03.27 | සිකුරාදා | 2009.03.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.